කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය

(බාහිර) - 2009

සමාජීය විද්‍යා පීඨය

පුරාවිද්‍යාව ARCH - E1025

පුරාවිද්‍යා මූලධර්ම හා විධිනියම

පුශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි කාලය : පැය 03 යි

---

01. පුරාවිද්‍යාඥයෙකු විසින් අදාළ මූලාශ්‍ර භාවිතකොට පුරාතනය ගොඩනගන අයුරු පැහැදිලි කරන්න.

02. මිනිසාගේ අතීතය සෙවීමේ දී පුරාවිද්‍යාවට වෙනත් විෂයයන්ගෙන් ලැබෙන පිටිවහල පරීක්ෂා කරන්න.

03. පුරාවිද්‍යාවේ දී දිරාපත්වීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? යන්න පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

04. අ) පුරාවිද්‍යා ක්ෂේත්‍ර ගවේෂණය යනු කුමක්ද?

ආ) ක්ෂේත්‍ර ගවේෂණයේ වැදගත් මූලධර්ම විස්තර කරන්න.

05. "ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කටයුතු සඳහා වඩා වැදගත්වන්නේ ප්‍රතිසංස්කරණයට වඩා ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය අනුගමනය කිරීමයි." මේ කියමනේ ඇති සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

06. නව පුරාවිද්‍යාව යනු කුමක්ද? එහි න්‍යායික මතවාද පුරාවිද්‍යාවේ වර්ධනයට ඉවහල් වූ අයුරු විස්තර කරන්න.

07. කැණීම් ඉතිහාසය කෙරෙහි අවධානය යොමුකරමින් පුරාවිද්‍යාඥයෙකු විසින් විවෘත කැණීම් ක්‍රමය වඩා ඵලදායී අයුරින් යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

08. පුරාවස්තු ආරක්ෂා කිරීම සම්බන්ධව පුරාවිද්‍යා ආඥා පනත හා සෙසු පනත් වලින් ලැබෙන පිටිවහල පරීක්ෂා කරන්න.

09. 1990 දශකයෙන් පසු මෙරට සිදුවූ පුරාවිද්‍යා පර්යේෂණ කටයුතු විෂය දියුණුවට දක්වා ඇති දායකත්වය පැහැදිලි කරන්න.

10. නිරපේක්ෂ කාලනිර්ණ ක්‍රම පුරාවිද්‍යාවට වැදගත්වන ආකාරය විස්තර කරන්න.

**************************